## ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මතය ව්‍යාවනය

----------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------

ආයතනය වෙත රජයේ සහ වෙනත් විදේශ ආයතන වෙතින් ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ප්‍රකාර ගිණුම් ගත කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේ දී ලෙජරයට වැරදි ලෙස කළ පිටපත් කිරීම් රු. 2,057,186 ක් ද, මූල්‍ය ප්‍රකාශනවලින් අත් හැරී තිබුණු රු. 7,635,756 ක ලැබීම් හා රු. 476,105 ක ගෙවීම් ද සඳහා අප විසින් කළ නිරීක්ෂණයන්ට අනුව අවශ්‍ය නිවැරදි කිරීම් කර අවසාන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණු නමුත් තව දුරටත් එවැනි ගිණුම්කරණ දෝෂ පැවැතිය හැකිය යන්න විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

(ආ) මුදල් පොත පිළියෙල කිරීමේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පිළිවෙලින් රු.7,635,735 ක් හා රු.419,822 ක් වූ සෘජු තැන්පතු හා නිත්‍ය නියෝග මූල්‍ය ප්‍රකාශවලින් අත්හැරී තිබුණි.

(ii) මුදල් පොතේ එකතුව නිවැරදි නොවූ අතර එහි පැවති සටහන් විගණනයේ දී කළ ගණනය කිරීම් අනුව 2011 දෙසැම්බර් 31 දිනට ලබා ගත් මුදල් පොතේ ශේෂය හා එදිනට මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ මුදල් ශේෂය අතර රු.913,859 ක වෙනසක් විය.

(iii) කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු මුදල් ශේෂයට රු.281,652 ක ජර්නල් සටහනක් යොදා අවසාන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණ ද, මුදල් පොතට එම ශේෂය ඇතුලත් කර නොතිබුණි.

(ඇ) 2011 ජනවාරි 01 දිනට පැවැති රු.602,030 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කිරීම සඳහා ජර්නල් සටහන් මගින් පිළිවෙලින් රු.8,685,922ක් හා රු.6,208,785 ක හර හා බැර කලද සමාලෝචිත වර්ෂයේ අවසාන වනවිටත් රු.311,065 ක බැර ශේෂයක් විය.

1.2.3 නොසැසඳු පාලන ගිණුම්

ජර්නල් සටහන් යෙදීමෙන් පසු ලබා ගත් ගිණුම් විෂයයන් 14 ක සංශෝධිත ශේෂයන් සහ අවසාන මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ එම ශේෂයන් අතර රු. 7,001,987 ක නොසැසඳුණු වෙනසක් විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ කිහිපයක සිට නිෂ්ක්‍රීයව පැවැති රු. 7,952,204 ක වත්කම් ශේෂ 08 ක් හා රු. 1,193,778 ක වගකීම් ශේෂ 02 ක් නිරවුල් කරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නො තිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.48,314,155 ක් වූ පහත සඳහන් ගිණුම් විෂයයන් 08 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ | 237,805 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| අනෙකුත් ණයහිමියෝ | 1,885,342 | උපලේඛන, ශේෂ තහවුරු කිරීම් හා කාල විශ්ලේෂණ |
| ගෙවිය යුතු ශේෂ | 1,299,978 | -එම- |
| ණයගැතියෝ | 14,517,332 | -එම- |
| සේවක ණය | 7,589,458 | -එම- |
| නිලධාරී වැටුප් | 944,643 | පත්වීම් ලිපි |
| ජර්නල් සටහන් | 18,676,433 | ජර්නල් වවුචර් |
| මුදල් පොතේ බැර සටහන් | 3,163,164 | ලිඛිත තහවුරු කිරීම් |
| | 48,314,155 | |

1.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදය | |
| 4.3.4 උප වගන්තිය | ආයතනය සතු සේවක නිවාස 05 සම්බන්ධයෙන් පොරොත්තු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| 5.8 උප වගන්තිය | සේවක නිවාසවල පදිංචිකරුවන්ගෙන් ජලය හා විදුලිය ගාස්තු අය කිරීමේ පිළිවෙතක් ආයතනය සතුව නොතිබුණි. නිවාස 03 ක විදුලි ගාස්තු වෙනුවෙන් ඉකුත් වර්ෂ 03 ක් සඳහා රු. 142,828 ක් |

ආයතනය වැය කර තිබුණි.

(ඇ) චක්‍රලේඛ

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | |
|---|---|---|
| (i) | අංක 41/90 හා 1990 ඔක්තෝබර් 10 දිනැති චක්‍රලේඛයේ 02 ඡේදය | ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාව ආයතනයේ වාහන සම්බන්ධයෙන් සිදු කර නො තිබුණි. |
| (ii) | 2006 නොවැම්බර් 25 දිනැති අංක 20/2006 දරන 04 හා 06 ඡේද | පොත් මිළ දී ගැනීම සඳහා ලබා දෙන විශේෂ අත්තිකාරම් නිකුත් කළ වර්ෂය තුල දී ම අය කර ගත යුතු වුවද, 2011 දෙසැම්බර් 31 දිනට විශේෂ අත්තිකාරම් ගිණුමේ රු. 298,700 ක ශේෂයක් පැවැතිණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.මිලියන 32.42 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාව රු.මිලියන 13.64 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 18.78 ක පිරිහීමට අනෙකුත් ආදායම් ඉපයීම් රු. මිලියන 10.3 කින් අඩු වීම හා මෙහෙයුම් වියදම් රු.මිලියන 19.21 කින් වැඩි වීම විශේෂයෙන් බල පා තිබුණි.

### 2.2 වියදම්වල වැඩිවීම හා ප්‍රාග්ධන බාදන අවස්ථාවන්

ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය පිළිබඳ නිශ්චිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර වාර්ෂිකව ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රජයෙන් ලැබී තිබුණු මුදල් සමඟ සමුච්චිත අරමුදල ලෙස රු. 240,649,046 ක් 2011 දෙසැම්බර් 31 දිනට දක්වා තිබුණි. එමෙන්ම, ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙහෙයුම් කටයුතුවලින් ලබා තිබුණු ඌනතාව හේතුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණු සමුච්චිත ඌනතාව රු. 140,789,491 ක් විය. සමාලෝචිත වර්ෂය දක්වා ලැබී තිබුණු සමස්ථ ප්‍රාග්ධන ප්‍රදාන සමුච්චිත අරමුදලින් ඉවත් කර සලකා බලන ලද්දේ නම් ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය දැඩි බාදනයකට ලක් වී සෘණ අගයක් ගන්නා බව නිරීක්ෂණය විය. කෙසේ නමුත් මෙම ප්‍රාග්ධන බාදනය දිගින් දිගටම පවතින්නේ නම්, ආයතනය පවත්වාගෙන යාම පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් ඇතිවීම වැලැක්විය නොහැකි ය.

2.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

ආයතනයේ ගණකාධිකාරීවරයෙකුගෙන් සමන්විත ගිණුම් අංශයක් තිබිය දී ගිණුම්කරණ කටයුතු වෙනුවෙන් විශ්‍රාමික ගණකාධිකාරීවරයෙකු 2011 සැප්තැම්බර් සිට කාර්ය පැවැරුම් පදනමට බඳවා ගෙන 2011 දෙසැම්බර් සිට අධ්‍යක්ෂ (පාලන) තනතුරට අයත් සියළු කාර්යයන් ද පවරා දී රු. 50,000 ක මාසික දීමනාවක් ගෙවා තිබුණි. තව ද, ඉකුත් වර්ෂ 04 ක බැංකු සැසඳුම් සකස් කිරීම වෙනුවෙන් 2011 ඔක්තෝබර් සිට නිලධාරිනියක් බඳවා ගෙන රු.36,000 ක දීමනාවක් ගෙවා තිබුණි.

2.4 අවිධිමත් ගණුදෙනු

---------------------

රු. 1,666,560 කට මිලදී ගත් පුහුණු උපකරණ 16 ක් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ඡේදය පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණු අතර 8.9.1 (ආ) උප ඡේදය පරිදි විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

3.1 කාර්ය සාධනය

----------------

සැලැසුම් කළ පුනරාවර්තන වියදම් ද ඇතුලත් කරමින් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැසුමක් මෙන්ම, සමාලොචිත වර්ෂයේ සමස්ත භෞතික ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොවීම නිසා සැලැසුම් ගත ඉලක්කයන් හා කාර්යසාධනය ඇගැයීමට නො හැකි විය. කෙසේ නමුත් ලබා ගන්නා ලද තොරතුරුවලට අනුව, පාඨමාලා සඳහා ශිෂ්‍ය සහභාගීත්වයේ ප්‍රගතිය පහත පරිදි විය.

| | පාඨමාලාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපාධි | | ඩිප්ලෝමා | | සහතික පත් | | මුළු | |
| | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 |
| වර්ෂයේ ආරම්භක සිසුන් සංඛ්‍යාව | 24 | 80 | 96 | 105 | 306 | 192 | 426 | 377 |
| වර්ෂය තුල බඳවා ගත් සිසුන් සංඛ්‍යාව | 50 | 49 | 157 | 102 | 443 | 506 | 650 | 657 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය තුල පුහුණුව නිම කළසිසුන් සංඛ්‍යාව | - | - | 128 | 89 | 344 | 374 | 472 | 463 |
| වර්ෂය තුල පාඨමාලාව හැර ගිය සිසුන් සංඛ්‍යාව | 05 | 10 | 20 | 49 | 182 | 161 | 207 | 220 |
| වර්ෂයේ අවසන් දිනට සිසුන් සංඛ්‍යාව | 75 | 119 | 105 | 69 | 223 | 163 | 403 | 351 |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වර්ෂය තුල බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාවට සාපේක්ෂව එම වර්ෂය තුල පාඨමාලා හැර යන සිසුන් සංඛ්‍යාව 33% ක ප්‍රමාණාත්මක ප්‍රතිශතයක් විය.

(ii) යාත්‍රා ඉදිකිරීම් හා නාවික වාස්තු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ වරාය කළමනාකරණය පිළබඳ උපාධි පාඨමාලා සැලැසුම් කළ නමුත් පවත්වා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂයේ දී ත් තකුණාමලය, මඩකලපුව හා යාපනය යන ප්‍රාදේශීය විද්‍යාලයන් හි ඩිප්ලෝමා පාඨමාලා අරඹා නොතිබුණි.

## 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2011 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩල විස්තර පහත පරිදි ය.

| තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 13 | 12 | 01 | - |
| මාණ්ඩලික නොවන | 225 | 128 | 97 | - |
| සුළු සේවක | 28 | 53 | - | 25 |
| එකතුව | 266 | 198 | 98 | 25 |

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) තථ්‍ය කාර්ය මණ්ඩලයෙන් 24% ක් කොන්ත්‍රාත් පදනම මත කළ බඳවා ගැනීම් විය. ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඍජු දායකත්වයක් සපයන කථිකාචාර්යවරුන්ගේ හා නාවික අංශයේ පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවෙන් පිළිවෙලින් 60% ක් හා 39% ක් විය.

(ආ) අනුමත මාසික වැටුප රු. 25,640 ක් වූ පාලක සහා හා නීති නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන භාණ්ඩාගාර අනුමැතියක් රහිතව මාසිකව දීමනාව රු. 35,000 ක් ගෙවා තිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 23,400 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) අංක 09/2007 හා 2007 මැයි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02, 03 හා 05 ඡේද පරිදි රජයේ විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස එකතුව රු. 388,085 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) අංක 26/2010 හා 2010 දෙසැම්බර් 31 දිනැත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුල දී නිලධාරීන් 14 දෙනෙකු කොන්ත්‍රාත් හා කාර්ය පැවරුම් පදනම මත බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස රු. 2,042,077 ක් ගෙවා තිබුණි.

(ඉ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (ආ), (ඇ) හා (ඈ) ඡේද පරිදි ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු සඳහා කාර්ය පැවරුම් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුල දී එකතුව රු. 1,308,118 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

3.4 වාහන උපයෝජනය

---------------------

ලබා දෙන ලද තොරතුරු අනුව ආයතනය සතුව වාහන 25 ක ඇණියක් පැවැති අතර සමාලෝචිත වර්ෂයේ වාහන භාවිතය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

අ) නැවත අළුත්වැඩියා කළ නො හැකි පරිදි දිරාපත්ව විනාශ වී තිබුණු පැරණි වාහන 07 ක් අපහරණය කිරීමට පියවර ගෙන නො තිබුණි.

ආ) ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් පරිත්‍යාග කළ වාහන 05 ක හා ධීවර අමාත්‍යාංශයෙන් ලද වාහන 01 ක හිමිකාරත්වය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නො තිබුණි.

## 04. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

4.1 සංයුක්ත සැලැස්ම

--------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 උප ඡේදය පරිදි පූර්ව තෙ වර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිපල පිළිබඳ සමාලෝචනයක් 2008-2011 කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැසුමෙහි අන්තර්ගතව නො තිබුණි. එමෙන්ම, මුදුන් පමුණුවාගත යුතු ඉලක්කයන් හි මූල්‍යමය අගයන් දක්වා නො තිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය මූල්‍යමය වශයෙන් ඇගැයීමට නො හැකි විය.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.1.3 උප ඡේදය පරිද පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්ම ඊ ලඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නො තිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

ඉහත චක්‍රලේඛයේ 5.1.2 උප ඡේදය පරිදි සැලැසුම්ගත කාල පරිච්ඡේදය තුල ලඟා විය යුතු අරමුණු හා ඉලක්ක සමගින් කළමනාකාරිත්වයේ වගකීම් පැහැදිලිව හඳුනාගත් ක්‍රියාකාරී සැලැසුමක් පිළියෙල කළ යුතු වුව ද, මිළ දී ගැනීමට අපේක්ෂිත ස්ථාවර වත්කම් සම්බන්ධ සැලැසුමක් පමණක් සකස් කර තිබුණි.

.3 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙ 4.3 (ඇ) වගන්තිය පරිදි ප්‍රවර්තන වර්ෂය තුල දී මිළ දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.4 අයවැය පාලනය

------------------

ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා මූලධන ප්‍රතිපාදන යටතේ 2011 වර්ෂය තුල රේඛීය අමාත්‍යාංශයෙන් ලද මුදලින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් වෙනුවට එම මුදලින් රු.5,900,206 ක් වැය කර අධ්‍යක්ෂ ජනරාල්වරයා භාවිතා කළ නිවස, කාර්යාලයක් බවට පත් කිරීමට හා මට්ටක්කුලිය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ වූ සභාපතිවරයාගේ නිවාසය අළුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබුණි. මෙම බැහැරවීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) සැපයුම් හා සේවා

(ආ) අයවැය පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(ඉ) වාහන අළුත්වැඩියා කිරීම

(ඊ) සේවක බඳවා ගැනීම්